SINHALI
HIGHLIGHTS LIFE CHRIST



# ක්‍රිස්තු ජීවිතයේ ප්‍රධාන සිද්ධීන්

## 6

### නැවත නැගිටි යේසුස් ස්වාමීන්

- යේසුතුමා වළලනු ලබයි
- යේසුතුමා යළි ජීවනයට එයි
- යේසුතුමා සිය සැලැස්ම පවසයි
- යේසුතුමා ස්වර්ගයට නැගෙයි
- යේසුතුමා පොරොන්දු ඉටු කරයි

# යේසුතුමා වළලනු ලබයි.

යේසුස් වහන්සේව අදහාගත් ආගමික නායකයන් දෙදෙනෙකු වන නිකදේමුස් සහ අරමාතියේ යෝසෙප් උන්වහන්සේව වැළලීමට පිලාත්ගෙන් අවසර ගත්හ. මළ බව සහතික කිරීමට එක් භේවායෙක් උන්වහන්සේගේ ඇලයකට හෙල්ලයකින් ඇන්න බැවින් උන්වහන්සේ මළ බව ඔවුන් දැනගත්හ. ඔවුහු උන් වහන්සේගේ මිනිය රෙදි වලින් ඔතා අලුත් සොහොන් ලෙනක තබා ලෙන් දොරටුව විශාල ගලකින් ආවරණය කළහ. උන්වහන්සේ කුරුස පත් කරන්ට නොහොත් ''ඔසවනු ලබන්ට'' ඕනෑය යන යේසුස් වහන්සේගේ වදන් නිකදේමුස්ට සිහිපත් විය.

> උන්වහන්සේ කෙරෙහි අදහාගන්නා සෑම දෙනම සදාකාල ජීවනය ලබන පිණිස මනුෂ්‍ය පුත්‍රයා ඔසවනු ලබන්ට ඕනෑය. මක්නිසාද දෙවියන්වහන්සේ තම එකම පුත්‍රයාණන් දෙන තරම් ලෝකයට ප්‍රේම කළ සේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහා ගන්න සෑම දෙනම විනාශ නොවී සදකාල ජීවනය ලබන පිණිසය. යොහන් 3:14–16

''තුන් දිනකට පසු මම ජීවනයට පැමිණෙන්නෙමි.'' යන යේසුස් වහන්සේගේ වදන් උන්වහන්සේගේ සතුරන්ට සිහිපත් විය. කිසිවෙකු පැමිණ මිනිය සොරකම් කොට යේසුස් වහන්සේ නැවත නැගිටුණේයයි කිව නොහැකි වන පිණිස ඔවුහු පිලාත් ලවා සෙබලුන් යවා සොහොන් ගෙය රකවල් කළෝය.

**ඔබේ අභ්‍යාසය සඳහා**

1. යේසුස් වහන්සේව වැලලුවේ කව්රුන්ද?

   ................................................සහ

   ................................................

2. නැවත ජීවනයට පැමිණෙන්නේ කී දවසකට පසුව යයි යේසුස් වහන්සේ කී සේක්ද?.........

   ..... ..........................................

3. යොහන් 3:14–16 හි යේසුස් වහන්සේ නිකදේමුස්ට කී දේ කට පාඩම් කරන්න.

ඉංග්‍රීසි – 1970 ජාත්‍යන්තර තැපැල් මාර්ගික අධ්‍යාපන ආයතනය
සිංහල – 1982 ජාත්‍යන්තර තැපැල් මාර්ගික අධ්‍යාපන ආයතනය

# යේසුතුමා යළි ජීවනයට එයි.

කුරුස පත්වීමෙන් තුන් දිනකට පසු ඉරිද හිමිදිරි පාන්දර යේසුස් වහන්සේ නැවත ජීවනයට පැමිණි සේක.

ඉරිද උදෑසන එළිය වැටෙන කල්හි මග්දලාහි මරියා සහ අනිත් මරියා සොහොන් ගෙය බැලීමට ගියහ. හදිසියේම එහි මහත් භූමි කම්පාවක් විය. ස්වාමීන් වහන්සේගේ දූතයෙකු ස්වර්ගයෙන් බැස ඇවිත් ගල ඉවතට පෙරලා ඒ මත හිඳ ගත්තේය. රැකවල්හු අතිශය බිය පත්ව, වෙව්ලා මළ අය මෙන් වූහ.



දේව දූතයා ඒ ස්ත්‍රීන්ට කථා කරමින්: ''භය නොවන්න, ඔබ කුරුසියෙහි ඇණ ගසන ලද යේසුස්වහන්සේව සොයන බව දනිමි. උන්වහන්සේ මෙහි නැත. උන්වහන්සේ කී ලෙසම නැගුටුන සේක. මෙහි පැමිණ උන් වහන්සේ උන් තැන බලා වහා ගොස් උන්වහන්සේ මළවුන්ගෙන් නැගුටුණු සේක, කියා ගෝලයින්ට කියන්න''යි කීවේය. එවිට ඔවුහු ගෝලයන්ට කීමට දිව්වෝය. හදිසියේම යේසුස් වහන්සේ ඔවුන්ට පෙනී ''සමාදානය වේවා''යි කී සේක. ඔවුහු ළඟට පැමිණ උන්වහන්සේගේ පාද වැළඳ නමස්කාරකළෝය. මතෙව් 28:1-9

යේසුස් වහන්සේ එදින පස් වතාවක් සිය හිතවතුන්ට පෙනුන සේක. උන්වහන්සේට වෙනස් ආකාර මහිමලත් ශරීරයක් තිබුණ නිසා වසන ලද දොරටු තුලින් යාමටත් අවශ්‍ය විටෙක පෙනී හා නොපෙනී යාමටත් පුළුවන් විය.

ඒ ඉරිද සවස ගෝලයෝ යුදෙව්වන්ට බියෙන් දොරවල් වසාගෙන එක් තැන් වී සිටියහ. එවිට යේසුස් වහන්සේ ඔවුන් මැද සිට ''නුඹලාට සාමය වේවා'' කීසේක. යොහන් 20:19

මුලින්ම ගෝලයන් සිතුවේ තමන් අවතාරයක් දකින්නේය කියාය. නමුත් ඔවුන් යේසුස් වහන්සේව ස්පර්ෂ කළ පසු හා උන්වහන්සේ ඔවුන් සමඟ කෑ පසු උන් වහන්සේ සැබැවටම නැවත ජීවනයට පැමිණි බව ඔව්හු දැන ගත්හ. ඒ වේලාවේ එතැන නොසිටි තෝමස් නම් ගෝලයා ඔවුන්ගේ කීම් අවිශ්වාස කළේය. ඊළඟ සතියේ ඔවුන් සියළු දෙනා එක්තැන්ව සිටියදී යේසුස්වහන්සේ හදිසියේම ඔවුන් මැද සිට ගත්තේය.

උන්වහන්සේ තෝමස්ට කථාකොට ''නුඹේ ඇඟිල්ල දිගු කොට මාගේ අත් බලාපන්න. නුඹේ අත් දිගු කොට මාගේ ඇලයෙහි බහාපන්න. සැකය නවතා විශ්වාස කරපන්න! කීසේක. තෝමස් උත්තර දෙමින් ''මාගේ ස්වාමීනි, මාගේ දෙවියනි!'' කීවේය. උන්වහන්සේ ඔහුට මෙසේ කී සේක. මා දුටු නිසා නුඹ විශ්වාස කරනවාද? නොදුක විශ්වාස කරන්නෝ කොපමණ වාසනාවන්තයෝද?



යොහන් 20:27–29

යේසුස් වහන්සේගේ මෙම වචන විශේෂයෙන්ම අප සඳහායි. උන්වහන්සේ සැබවින්ම මලවුන්ගෙන් නැගිටි බව විශ්වාස කිරීමට අපට දකින්ට උවමනා නැත. උන් වහන්සේ හතලිස් දවසක් තුල වරින් වර ගෝලයින් හමුවී ඔවුන්ට ඉගැන්වූ සේක. ඔවුහු ඒ පිළිබඳව බයිබලයේ ලිව්වෝය. යේසුස් වහන්සේ නැවත ජීවත් වන බව කීම නිසා ඔවුන්ගේ සතුරෝ ඔවුන්ට කසයෙන් තලා ඔවුන්ව සිරගෙයි දැමුවෝය. එහෙත් එය සත්‍ය බව ඔව්හු දැන සිටියහ. එය එසේ නොවේ යයි කියනවාට වඩා ඔව්හු මරණයට වුවද සූදානම්ව සිටියහ. ඔව්හු යේසුස් වහන්සේගේ නැවත නැගිටීම පිළිබඳ සාක්ෂිකාරයෝය.

## ඔබේ අභ්‍යාසය සඳහා

4. යේසුස් වහන්සේ නැවත නැඟුටුනේ සතියේ කීවෙනි දවසේදීද? ..............................

5. කී දවසක් තුල යේසුස් වහන්සේ සිය අනුගාමික යන්ට පෙනුන සේක්ද?..........................

6. තමන් ආත්මයක් පමණක් නොවන බව දක්වීමට උන්වහන්සේ ඔවුන්ට පෙන්වූ සාධක මොනවාද?

   ... (අ) තම වචනය පිළිගන්ට යයි උන් වහන්සේ ඔවුන්ට කී සේක.

   ... (ආ) උන්වහන්සේ ඔවුන් සමඟ ආහාර ගෙන තමන් ඇල්ලීමට ඔවුන්ට ඉඩහල සේක.

   ... (ඇ) උන්වහන්සේ ඔවුන්ට කිසි සාධක යක් දුන්නේ නැත.

7. තෝමස් යේසුස් වහන්සේව ඇමතුවේ කෙසේද?

   ..................................................

# යේසුතුමා සිය සැලැස්ම පවසයි.

යේසුස් වහන්සේගේ සැලැස්ම වූයේ සෑම ඇදහිලිවන්තයෙක්ම අන්‍යයන්ට උන්වහන්සේ ගැන කියන සාක්ෂි කාරයකු වීමයි. උන්වහන්සේ මෙසේ පැවසූ සේක.

> ''ස්වර්ගයෙහිද පොළොවෙහිද සියළු බලය මට දී තිබේ. එබැවින් නුඹලා සෑම ස්ථානයටම ගොස් සියළු මනුෂ්‍ය වර්ගයන් මාගේ ගෝලයන් කරපල්ලා. පියාණන්ගේත්, පුත්‍රයාණන්ගේත්, ශුද්ධාත්මයාණන්ගේත් නාමයට ඔවුන් බව්තීස්ම කරපල්ලා. මා විසින් නුඹලාට අණකළ සියල්ලම පවත්වන්නට ඔවුන්ට උගන්වාපල්ලා.'' මතෙව් 28:18–20

ඔවුන් තුළ ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය නැතිව තම සැලැස්ම ක්‍රියාත්මක කිරීමට සිය අනුගාමිකයින්ට නොහැකි බව යේසුස් වහන්සේ දැන සිටිසේක. එබැවින් උන්වහන්සේ මෙසේ පැවසූ සේක.

> ''ගැළවුම් කාරයාණන් වධ විඳින්ටත් තුන් වැනිද මළවුන්ගෙන් නැගිටින්නටත් සියළු ජාතීන්ට පසුතැවිල්ල හා පව් කමාවද උන් වහන්සේගේ නාමයෙන් ප්‍රකාශ කරනු ලබන්ටත් යුතු යයි ලියා තිබේ. නුඹලා සාක්ෂි කාරයෝය. නමුත් ඉහළින් නුඹලා වෙත බලය ලැබෙන තුරු නුවර නැවතී සිට පල්ලා. ලූක් 24:46–49



### ඔබේ අභ්‍යාසය සඳහා

8. මතෙව් 28:18–20 සහ ලූක් 24:46–49 හි එන යේසුස් වහන්සේගේ වචන පස්වරක් කියවන්න.
9. යේසුස්වහන්සේගේ සැලැස්ම ලෙස උන් වහන්සේ කෙරෙහි අදහන්නාවූ අය, කළ යුතු වන්නේ:
   - ... (අ) දේශපාලන රාජ්‍යයක් සංවිධානය කිරීමය.
   - ... (ආ) ගැලවීම භුක්ති විඳීමය.
   - ... (ඇ) යේසුස් වහන්සේ ගැන සාක්ෂි දැරීමය.
10. යේසුස් වහන්සේගේ සාක්ෂිකාරයන් වීම සඳහා අනුගාමිකයන්ට අවශ්‍ය වූයේ කුමක්ද?
    - ... (අ) ශුද්ධාත්මයාණන්ගේ බලය.
    - ... (ආ) රජයේ අනුමැතිය.
    - ... (ඇ) අනගි දේවස්ථානයක්.

# යේසුතුමා ස්වර්ගයට නැගෙයි.

යේසුස් වහන්සේ ඔවුන්ට කියන සේක්: ''ශුද්ධාත්මයාණන් වහන්සේ නුඹලා කෙරෙහි පැමිණි කල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුය.'' උන්වහන්සේ මෙසේ කී කල්හි ඔවුන් බලා සිටියදීම ස්වර්ගයට ඔසවා ගනු ලැබ වළාකුලකින් වැසී ඔවුන්ට නොපෙනී ගිය සේක.

උන්වහන්සේ ගිය නමුත් ඔවුන් අහස දෙස බලමින් සිටියදීම සුදු වස්ත්‍ර ඇන්දාවූ මනුෂ්‍යයින් දෙදෙනෙක් හදිසියේම ඔවුන් ලඟ සිට ගලීලයේ මනුෂ්‍යයිනි නුඹලා ඔතැන සිට අහස දෙස බලා සිටින්නේ මන්ද? නුඹලා කෙරෙන් ස්වර්ගයට ඔසවා ගනු ලැබූ මේ යේසුස් වහන්සේ ස්වර්ගයට යනවා නුඹලා දුටු ආකාරයෙන්ම එනවා ඇත''යි කීවෝය. ක්‍රියා 1:7–11

ගෝලයෝ ශුද්ධාත්මයාණන් වහන්සේ ගැන බලාපොරොත්තුව යෙරුසලමට ආපසු යන අතර යේසුස් වහන්සේ ඔවුන්ට කී කාරණා ගැන සිතුවෝය.



මාගේ පියාණන්ගේ ගෘහයෙහි බොහෝ වාසස්ථාන තිබේ. මම නුඹලාට ස්ථානයක් පිළියෙල කරන්ට යමි. මා සිටින තැන නුඹලාත් සිටින පිණිස මම නැවත පැමිණ නුඹලා මා වෙතට ගනිමි.'' යොහන් 14:2–3

### ඔබේ අභ්‍යාසය සඳහා

11. යේසුස් වහන්සේ ස්වර්ගයට නැගුනේ කෙසේද?
    - ... (අ) උන්වහන්සේ ශරීරාකාරව ඔසවා ගනු ලැබීය.
    - ... (ආ) උන්වහන්සේ අභ්‍යවකාශ යානයකින් ගිය සේක.
    - ... (ඇ) උන්වහන්සේ නොපෙනී ගිය සේක.

12. යේසුස් වහන්සේ පොරොන්දු වූයේ කුමක් කිරීමටද?
    - ... (අ) ගෝලයන් උදෙසා නැවතී සිටීමට
    - ... (ආ) ශුද්ධාත්මයාණන් එවීමට
    - ... (ආ) ලෝකය පාලනය කිරීම ඇරඹීමට

# යේසුතුමා පොරොන්දු ඉටු කරයි.

යේසුස් වහන්සේ ස්වර්ගයට නැඟී දස දිනකට පසු ශුද්ධාත්මයාණන් වහන්සේ පැමිණ ඇදහිලිවන්තයින්ව පිරවූ සේක. යේසුස් වහන්සේ ගැන අන්‍යයන්ට කීමට ඔවුන් බලය ලැබුයේ එතැන් පටන්ය. ඔවුන්ව සිරගත කරනු ලැබුවත් තලනු ලැබුවත් ඔවුන් දිගටම සාක්ෂි දැරූහ. ඔවුන්ගේ ජීවිත බේරා ගැනීමට ඔවුන් යෙරුසලමෙන් පලා ගියත් ඔවුන් ගිය සැම තැනකදීම ගැළවුම්කාරයාණන් ගැන ශුභාරංචිය පැවසූහ. යේසුස් වහන්සේ තම පොරොන්දුව ඉටු කළ සේක. උන්වහන්සේ තවමත් ඇදහිලිවන්තයින්ව ශුද්ධාත්මයාණන්ගෙන් පුරවමින් උන්වහන්සේ ගැන සාක්ෂි දරන්ට බලය දෙන සේක. ආපසු පැමිණීමට වූ තම පොරොන්දුවත් උන්වහන්සේ ඉටු කරන සේක. ඉතා ඉක්මනින්ම උන්වහන්සේගේ පැමිණීම අපි බලාපොරොත්තු වෙමු.

> ස්වාමීන් වහන්සේම ස්වර්ගයෙන් බස්නා සේක. ක්‍රිස්තුස් වහන්සේ තුළ අදහමින් මලාවූ අය පළමු කොට ජීවනයට ගෙනෙනු ලබන්නෝය. එවිට ජීවත්ව ඉතිරිව සිටින අපි එක විටම ඔවුන් සමඟ ස්වාමින්වහන්සේ සම්මුඛ වන පිණිස වලාකුල් වලින් අහසට ඇදගනු ලබන්නෙමුව. මෙසේ අපි නිතරම සවාමීන් වහන්සේ සමඟ සිටින්නෙමු. 1 තෙසලෝනික 4:16–17

යේසුස් වහන්සේ අද පැමිණෙන්නේ නම් ඔබ සූදනම්ද? ඔබ කැමති නම් මෙම යාච්ඤාව කිව හැකිය.

**යාච්ඤාව**

යේසුනි, මාගේ ගැළවුම්කාරයා ලෙසත් මාගේ ජීවිතයේ ස්වාමියා ලෙසත් මම ඔබවහන්සේව පිළිගනිමි. මාගේ සියළු පාප වලට කමා වුව මැනව. ඔබගේ ශුද්ධාත්මයෙන් මා පුරවනු මැනව. අන්‍යයන්ට ඔබ ගැන කීමට මට උපකාර කළ මැනව. මා මැරුණත් ඔබ පැමිණෙන තුරු මා ජීවත්ව සිටියත් ස්වර්ගයෙහි ඔබගේ ගෘහයෙහි සදාකාලයටම ඔබ සමඟ සිටිනු පිණිස මාව ගනු මැනව.

ඔබගේ නම. ..........................................

**ඔබේ අභ්‍යාසය සඳහා**

13. 1 තෙසලෝනික 4:16–17 පස්වරක්කියවන්න. යේසුස් ස්වාමීන් වහන්සේගේ පැමිණීමට ඔබ සූදනම් වසිටින්නේද?............................

## අදහස්

මෙම පාඩම් කෙලෙස ඔබට ප්‍රයෝජනවත් විද?

..............................................................................

..............................................................................

..............................................................................

## ශුභ පැතුම්

ඔබ දැන් ක්‍රිස්තු ජීවිතයේ ප්‍රධාන සිද්ධීන් අධ්‍යයනය කර තිබේ. ඔබ අපගේ ශිෂ්‍යයෙකු වීම ගැන අප සතුටු වන අතර ජාත්‍යන්තර තැපැල් මාර්ගික අධ්‍යාපන ආයතනයෙන් තවත් බොහෝ පාඩම් මාලා හදාරනු ඇතැයි බලාපොරොත්තු වෙමු. ඔබ උගත් දේ භාවිතාවට නැංවීමට දෙවියන් වහන්සේ ඔබට ආශීර්වාද කරන සේක. පාඩම් හයේම ඔබගේ පිළිතුරු පරීක්ෂා කළ විගස අපි ඔබගේ සහතිකය එවන්නෙමු.

ඔබේ නම ..................................................

ලිපිනය ..................................................

දිස්ත්‍රික්කය ..................................................

වයස.............. ස්ත්‍රී පුරුෂ භාවය...........

**අපේ ලිපිනය**

**ජාත්‍යන්තර තැපැල් මාර්ගික අධ්‍යාපන ආයතනය**

**තැ. පෙ. 102.**
**කොළඹ 6.**

සීමාසහිත ඉවැන්ජල් මුද්‍රණාලය 490/8 හැව්ලොක් පාර කොළඹ 6.